**නාගොඩ ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

-------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 28 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 නොවැම්බර් 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට නාගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.2,360,670 ක දායක මුදල් ගිණුම්ගත කර නොතිබීමෙන් වර්ෂයේ වියදම් හා ජංගම බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට සභාවේ තිබූ කොම්පෝස්ට් පොහොර තොගයේ වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබීම නිසා ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.35,988,097 ක් වූ ගිණුම් විෂයයන් 10 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර නිරීක්ෂණය වූ අසමානතා වල එකතුව රු.9,533,109 ක් විය.

#### 1.3.3 අවිනිශ්චිත ගිණුම

2008 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවති එකතුව රු.18,314 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන අදාළ ගැලපීම් කර, ගිණුම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.23,374,779 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 07 ක වටිනාකම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.16,070,719 ක් වූ හිඟහිටි ආදායම් ගිණුමේ ශේෂය හඳුනාගෙන එම මුදල් අයකරගෙන අදාළ ගැලපීම් කර, ගිණුම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සිට පැවත එන එකතුව රු.1,084,926 ක ගෙවිය යුතු මුද්දර බදු දීමනා සහ 2012 වර්ෂයේ සිට පැවත එන රු.1,968,246 ක වැට් බදු තැන්පත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය නොකර, සභාවේ පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 10 ක කාලයක් ඉක්ම වූ එකතුව රු.3,308,578 ක් වූ ණයගිමි ශේෂයක් පැවැතුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු.85,338,093 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද වත්කම් පන්ති අනුව පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය සහ උපලේඛන ද, රු.9,898,199 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පත් සම්බන්ධයෙන් විධිමත් පරිදි යාවත්කාලීන කරන ලද තැන්පත් ලේඛනය ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත විස්තර දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| **නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 396(ඇ) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ක කාලයක් ඉක්ම වූ එකතුව රු.72,005 ක් වටිනා චෙක්පත් 33 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1645 හා 1646 | සමාලෝචිත වර්ෂයේ දී සභාවට අයත් වාහන 10 ක් වෙනුවෙන් දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.4,944,750 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.2,444,034 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,500,716 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආදායම ඉක්මවා රු.1,473,262 ක ප්‍රාග්ධන වියදම් දරා ඇති බව නිරීක්ෂණය විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 අක්කර බදු

හිඟ අක්කර බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු.230,434 ක හිඟ බදු ශේෂයක් පැවැතුණි.

#### 2.2.2 බදු කුලී හා නිවාස කුලී

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා වර්ෂය අවසාන වනවිට තවත් රු.287,850 කින් හිඟය ඉහල ගොස් තිබුණි.

#### 2.2.3 පොළ බදු

සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,586,700 ක් වූ හිඟ මුදල් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර, ක්‍රියාත්මක කර නොතිබුණි.

#### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.7,345,150 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.1,840,928 ක් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යසාධනය

----------------

2016 වර්ෂයේ අයවැය ලේඛනයට අනුව සභා බලප්‍රදේශයේ ඉඩම් හෙක්ටයාර් 17,471 ක් වූ නමුත්, අයවැයගත අක්කර බදු ආදායම රු.115,000 ක් විය. ඒ අනුව සභා බලප්‍රදේශයේ භූමි ප්‍රමාණය නොසලකා අක්කර බදු ආදායම ඇස්තමේන්තු කර ඇති බව නිරීක්ෂණය විය.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) **කාර්යමණ්ඩල කළමනාකරණය**

-----------------------------------

(i) 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කලමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූල නොවී සභාව විසින් අනියම්, තාවකාලික, කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 10 දෙනෙකු බඳවාගෙන 2016 වර්ෂය තුළදී වැටුප් හා දීමනා වශයෙන් රු.1,611,900 ක මුදලක් ගෙවා තිබුණි.

(ii) පෙර පාසල් පාලිකා අනුමත තනතුරු සංඛ්‍යාව 03 ක් වුවද, 09 දෙනෙකු බඳවාගෙන ස්ථිර කර තිබුණි. ඊට අමතරව තවත් 06 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම නිසා අතිරික්ත පෙර පාසල් පාලිකාවන් 12 දෙනෙකු සිටින බව නිරීක්ෂණය විය.

**(ආ) සභාව සතු කඩ කාමර බදු දීම**

-------------------------------

**(i) මාපලගම පැරණි කඩ කාමර**

------------------------------

* මාපලගම මංසන්ධියේ පිහිටි පැරණි කඩ කාමර 04 ක් බදු ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව 1971 වර්ෂයේ සිටම බදු දී තිබුණු බව නිරීක්ෂණය විය.

* මාපලගම පැරණි කඩ කාමර අංක 01, හිස්ව පැවැතීම නිසා සභාවට කිසිදු ආදායමක් උපයාගත නොහැකිව තිබුණි.

**(ii) තල්ගස්වල කඩ කාමර**

------------------------

* තල්ගස්වල කඩ කාමර 05 ක් පවතින අතර, ඒ සඳහා වලංගු බදු ගිවිසුම් නොතිබුණු බව නිරීක්ෂණය විය.

* පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක:දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයට පටහැනිව කඩ කාමර අංක 02 සහ 05 බදු දී තිබුණි.

**(iii) මාපලගම වෙළඳ සංකීර්ණය**

-------------------------------

* මාපලගම වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 06, 2012 වර්ෂයේ මාර්තු මස සිට බදු දී නොතිබීම හේතුවෙන් උපයාගත හැකිව තිබූ කඩ කුලී ආදායම සභාවට අහිමි වී තිබුණි.

* උඩු මහලේ අංක 02 සහ බිම් මහලේ අංක 05 කඩ කාමරය සඳහා වලංගු බදු ගිවිසුම් නොතිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-----------------------------**

**ව්‍යාපෘති ප්‍රමාද කිරීම**

**----------------------**

සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ රු.3,700,000 කට ඇස්තමේන්තු කරන ලද කර්මාන්ත 10 ක් හා යටිතල පහසුකම් නඟා සිටුවීමේ ප්‍රාග්ධන වැඩසටහන යටතේ රු.1,250,000 කට ඇස්තමේන්තු කරන ලද කර්මාන්ත 02 ක් සමාලෝචිත වර්ෂය තුළදී ඉටු නොකර, අතහැර දමා තිබුණි.

**3.4 නිෂ්ක්‍රිය / ඌණ උපයෝජිත වත්කම්**

--------------------------------------

සභාව සතුව තිබුණු බැකෝ ලෝඩර් යන්ත්‍රයක්, බවුසරයක්, ගාබේජ් ට්‍රේලරයක් හා ටේලර් 02 ක් භාවිතයට නොගැනීම මත අපහරණය කිරීමට 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි කටයුතු කර නොතිබුණි.

**3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

**-------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් එකතු කරනු ලබන නොදිරන කසළ හා දිරන කසළ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා අවශ්‍ය කටයුතු ඉටු කිරීමකින් තොරව අප්තොප්වත්ත ඉඩමෙහි වූ වලවල්වලට දමා තිබුණි.

(ආ) සභාව විසින් එකතු කරනු ලැබූ නොදිරන කසළ, අංගනයෙන් පිටත ස්ථානයක ගොඩගසා තිබුණු අතර, එම කසළ වර්ගීකරණය කිරීමක් සිදුකර නොතිබුණි. එමෙන්ම ප්ලාස්ටික් භාජන මත හා ටයර්වල ජලය රැස් වී තිබූ අතර, එම අපද්‍රව්‍ය විධිමත්ව බැහැර කිරීමට සභාව විසින් සැලසුම් සකස් කර නොතිබීම නිසා විවිධ රෝගාබාධයන්ට හා සමාජයීය ගැටළු ඇතිවීමේ අවදානමක් පැවතුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---------------------------------------

### 4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 4.2 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

---------------------------------------------------------

ඉකුත් වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාවේ 2.2.1 ඡේදයේ (ආ), (ඇ), සහ 2.2.3 යන ඡේදයන්ගෙන් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට එකඟ වී තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂයේදී අදාළ නිවැරදි කිරීම් කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

------------------------

සමාලෝචිත වර්ෂයේ දී සභාව මඟින් අභ්‍යන්තර විගණනය සඳහා නිලධාරීන් 03 දෙනෙකු වරින් වර පත්කර තිබුණු අතර, අභ්‍යන්තර විගණනය පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක : දපපා/යහ/01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

---------------------------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කලමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

--------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර විගණන විමසුම් මඟින් සභාවේ අවධානයට යොමු කරන ලදී. පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධතිය | | පද්ධතියේ ප්‍රධාන අඩුපාඩු |
|---|---|---|---|
| (අ) | වාහන පාලනය | (i) | නිෂ්ක්‍රීය වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | වාහන 10 ක දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| | | (iii) | ඇතැම් වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ලේඛන නඩත්තු කිරීම | (i) | යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, පරිගණක සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනය යනාදී ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| | | (ii) | ආපසු ගෙවිය යුතු තැන්පත් ලේඛන යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) | ආදායම් රැස්කිරීම | (i) | සංවර්ධිත ප්‍රදේශවල වරිපනම් අයකල හැකි දේපළ හඳුනාගෙන වරිපනම් අයකර ගැනිමට පියවර ගෙන නොතිබුණි. |
| | | (ii) | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| | | (iii) | මුද්දර ගාස්තු, උසාවි දඩ ආදායම් යාවත්කාලීනව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iv) | කඩ බදු ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | | (v) | නව ආදායම් උත්පාදන වැඩසටහන් කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි. |
| (ඈ) | සේවක මණ්ඩල කළමනාකරණය | (i) | කාර්යමණ්ඩලය පුරප්පාඩු පුරවා ගැනීමට මෙන්ම අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | සභාවේ සේවය කළ නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iii) | ජ්‍යෝෂ්ඨ නිලධාරීන් විසින් ඉටු කලයුතු කාර්යයන් සඳහා ක්ෂේත්‍ර කම්කරුවන් සේවයේ යොදවා තිබුණි. |
| (ඉ) | ගිණුම්කරණය | (i) | ඉකුත් වර්ෂවල සිට නොවෙනස්ව ඉදිරියට එන ගිණුම් ශේෂ පිළිබඳව සොයා බලා අවශ්‍ය ගැලපීම් කර, ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | මූල්‍ය ප්‍රකාශන සහ ඊට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර පවතින වෙනස්කම් හඳුනාගෙන ඒවා නිවැරදි කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. |

(iii) නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත් 33 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(iv) වසර දෙකක කාලයක් ඉක්මවා තිබුණු තැන්පතු ශේෂ හඳුනාගෙන ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) අයවැය පාලනය

ආදායම් විෂයයන් 05 ක සියයට 8 ත් 24 ත් අතර පරාසයක අහිතකර විචලනයන් දක්නට ලැබුණි.